# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2207/9 - 2020 දෙසැම්බර් මස 23 වැනි බදාදා - 2020.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය සමග කියවිය යුතු 66ඈ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් එම්. එම්. විජේනායක වන මම, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය සමග කියවිය යුතු 66ඈ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත තුළ පිහිටියා වූ මහියංගණය ප්‍රාදේශීය සභාවෙහි පුරප්පාඩු වී ඇති සභාපති ධුරය සඳහා අලුත් සභාපතිවරයකු තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා වන රැස්වීම 2020 ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින පෙ.ව. 11.00 ට මහියංගණය ප්‍රාදේශීය සභාව, මහියංගණය යන ලිපිනයේ පිහිටි මහියංගණය ප්‍රාදේශීය සභාවේ සභා ගර්භය යන ස්ථානයේ දී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**එම්. එම්. විජේනායක,**
පළාත් පාලන කොමසාරිස්,
ඌව පළාත.

2020 දෙසැම්බර් මස 22 වැනි දින,
බදුල්ල, මාටින් සිල්වා මාවතේ පිහිටි,
ඌව පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

1A - G 33363 — 25 (2020/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.